# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | : | බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව |
| **දිනය** | : | 2013.01.29 |
| **වේලාව** | : | පෙ.ව. 10.00 |

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 6. | ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | ගරු නාගරික මනත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 8. | ගරු නාගරික මනත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

- ගරු නාගරික මන්ත්‍රී, අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා හට මෙදින මහා සභා රැස්වීමට පැමිණීමට නොහැකි බැවින් නිවාඩු ලබා දෙන මෙන් ඉල්ලා ලිපියක් එවා තිබූ අතර, එම නිවාඩු අනුමත කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**නිලධාරී සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | ලේකම් | එම්. එච්. සීලවතී මිය |

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

සභා රැස්වීම් වාර්තාව සම්බන්ධව වෙනත් අදහස් දැක්වීම් නොවූ බැවින් එය කියවූ ලෙස සලකා මහා සභාවේ ඒකමතිකව සම්මත කරන ලදී.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

ගරු සභාපතිතුමා සභාව අමතමින් මේ පවත්වන්නට යෙදෙන්නේ 2013 වර්ෂයේ ජනවාරිමාසයට අදාල මහා සභා රැස්වීම බව දැනුම් දෙන ලදී. පසුගිය සභා වාරයේ දී තීරණය කර ගත් පරිදි මෙම වසරේ සිට මහා සභා රැස්වීම සෑම මාසයකම අවසාන අඟහරුවාදා දිනයේ පවත්වන බව ද සඳහන් කළේය.

ගරු සභාපතිතුමා වැඩිදුරටත් සභාව අමතමින්, මෙම සභා වාරයට පැමිණි ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ පුවත්පත් කලාවේදී මහතුන් ඇතුළු සියළු දෙනා ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 ඒ - 17 දරන කඩ කාමරයේ බදු අයිතිය පවරා දීම

බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ ඒ - 17 දරන කඩකාමරයේ පවත්වාගෙන යාමට නොහැකි බව ද, බැවින් එය ඉදිරියට පවත්වාගෙන යාම සඳහා බළන්ගොඩ, ෆලීල් හාජියාර් මාවතේ අංක ඒ 32 පදිංචි, මොහොමඩ් ජෙබ්බාර් මොහොමඩ් හිෂාම් යන අයට පවරා දෙන මෙන් ඊ. ඒ. චන්ද්‍රලතා යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව සඳහන් කළ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා අදාල කඩ කාමරය 25%ක් අය කර බදු ලබා දීමට යෝජනා කරන ලදී.

මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් හෝ යෝජනා ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය

### 06:02 173, 173/1, 173/2, 173/3, 173/4, 173/5, 173/6, 173/7. 173/8, 173/9, 173/10 යන අංකයන්හි වෙළඳකුටි සඳහා වරිපනම් ඉවත් කර ගැනීම

173, 173/1, 173/2, 173/3, 173/4, 173/5, 173/6, 173/7. 173/8, 173/9, 173/10 යන ගොඩනැගිලි සඳහා වරිපනම් ඉවත් කරන මෙන් එම්. එස්. පී. ගලප්පත්ති යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව සඳහන් කළ ගරු සභාපතිතුමා වරිපනම් බදු වලින් අඩක් නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:03 ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ වාර්ෂික දායක මුදල පිළිබඳව

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ සාමාජිකත්වය සඳහා මාසික දායක මුදල වන රු. 10,000.00 ගෙවීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 ආනන්දනීය අවුරුදු උදානය - 2013 - බලන්ගොඩ විශේෂ විකාශය**

අලුත් අවුරුදු සමය වෙනුවෙන් 'ආනන්දනීය අවුරුදු උදාන - 2013' නමින් විකාශයක් බලන්ගොඩ නගරය ආවරණය වන අන්දමින් 2013 අප්‍රේල් මස 08 වන දින සිට 12 වන දින දක්වා සිදු කිරීමට නාලක ජේ. හෙට්ටිආරච්චි යන අය විසින් ඉල්ලීමක් සිදු කර ඇති බව සඳහන් කළ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කළේය.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, පසුගිය මහා සභා රැස්වීමේ 06:04 අනුව අවසර ලබා දී දැනට බස්නැවතුම්පොලේ සිදු කරන 'නිම්නද රේඩියෝ' විකාශයට බාධාවක් නොවන පරිදි අදාල කාල සීමාව සඳහා මෙම විකාශය සඳහා අවසර ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:05 වරිපනම් සහන ලබා ගැනීම - අංක 99**

බලන්ගොඩ, හපුතලේ පාර අංක 99 දරන ස්ථානයේ පිහිටා ඇති ව්‍යාපාරික ස්ථානය දැනට වසරකට පෙර සිට වසා දමා ඇති බැවින් ඒ සඳහා වරිපනම් සහනයක් ලබා දෙන මෙන් එම්. අමරසේන යන අය විසින් ඉල්ලා ඇති බව සඳහන් කරන ලද ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා අදාල වරිපනම් මුදලින් 50%ක් අඩු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනස් අදහස් ඉදිරිපත් නොවූ බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:06 වරිපනම් බදු නිදහස් කිරීම - අංක 130**

බලන්ගොඩ, හපුතලේ පාර අංක 130 දරන ස්ථානයේ පිහිටා ඇති දේපල කලක සිට වසා දමා ඇති බැවින් ඒ සඳහා වරිපනම් නිදහස් කර දෙන මෙන් ඒ. එම්. ෆලීල් හාජ්ජියාර් යන අය විසින් ඉල්ලා ඇති බව සඳහන් කරන ලද ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා අදාල වරිපනම් මුදලින් 50%ක් අඩු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනස් අදහස් ඉදිරිපත් නොවූ බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:07 බදු මුදල් නිදහස් කර ගැනීම - අංක 130 හා 132/1 කඩ කාමර**

බලන්ගොඩ, තුඹගොඩ පිහිටි අංක 130 හා 132/1 කඩ කාමර වසා දමා ඇති බැවින් අදාල කඩ කාමර 02 සඳහා බදු මුදල් නිදහස් කර දෙන මෙන් ඒ. එම්. පලීල් යන අය විසින් ඉල්ලා ඇති බව සඳහන් කරන ලද ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා අදාල වරිපනම් මුදලින් 50%ක් නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. විරුද්ධව අදහස් නොවූ බැවින් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 පොදු වෙළඳසැල මාලු කඩය නැවත භාර දීම**

පොදුවෙළඳසැල අංක 12 මාළු කඩය නැවත නගර සභාවට භාර දීම සඳහා ඩී. වී. රංජිත් යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව දැක්වූ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා, අදාල වෙළඳසැල භාරගෙන ටෙන්ඩර් කැඳවා වෙනත් අයකුට ලබා දීමට යෝජනා කරන ලදීඳ

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 පදික වේදිකාවේ බිම් කොටසක් ලබා ගැනීම**

බස්නැවතුම්පොල මාර්ගයේ මාසික කුලී පදනම යටතේ තමන්ගේ වියදමින් වෙළඳසැලක් ඉදිකිරීම සඳහා ජී. අයි. පුෂ්පා ප්‍රියානි යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දන්වන ලද අතර ඒ සඳහා 2013.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ගිවිසුම් අත්සන් කර අවසර ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 බස්නැවතුම්පොල අසළ කඩ කාමරයක් ඉදිකිරීම**

බස්නැවතුම්පොල මාර්ගයේ මාසික කුලී පදනම යටතේ තමන්ගේ වියදමින් වෙළඳසැලක් ඉදිකිරීම සඳහා ඒ. අක්බර් රියාඩ් යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දන්වන ලද අතර ඒ සඳහා 2013.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ගිවිසුම් අත්සන් කර අවසර ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:11 බස්නැවතුම්පොල අසළ කඩ කාමරයක් ලබා ගැනීම**

බස්නැවතුම්පොල ඉදිරියේ ඉදිවන කඩ කාමරයක් තමන්ගේ වියදමින් හා මාසික කුලී පදනම මත ලබා ගැනීම සඳහා ටී. එම්. උදය බණ්ඩාර යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දන්වන ලද අතර ඒ සඳහා 2013.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ගිවිසුම් අත්සන් කර අවසර ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:12 බස්නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ ඒ - 17 දරන කඩ කාමරයේ බදු අයිතිය ලබා ගැනීම**

බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ ඒ - 17 දරන කඩ කාමරයේ බදු අයිතිය ලබා දෙන මෙන් මොහොමඩ් ජෙබ්බාර් යන අය විසින් ඉල්ලා ඇති බව සඳහන් කළ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා, 25%ක් අයකරගෙන බදු පදනම මත ලබා දීමට යෝජනා කළේය.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:13 වරිපනම් නිදහස් කර ගැනීම - 321/1**

මිරිස්වත්ත, බළන්ගොඩ පිහිටි වරිපනම් අංක 321/1 දරන ගොඩනැගිල්ල වසා දමා ඇති බැවින් එම ගොඩනැගිල්ල සඳහා වරිපනම් බදු නිදහස් කර දෙන මෙන් මංජුල කිත්සිරි ගවරම්මාන යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් දන්වන ලද අතර අදාල ගොඩනැගිල්ල සඳහා 50%ක ප්‍රමාණයකින් බදු නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## පසුව ලැබෙන ලිපි

### 6:14 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම

2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති ලිපිය ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, එමගින් දැක්වෙන පරිදි සභාවට අදාල චෙක්පත් අත්සන් කිරීම සඳහා සභාවේ ගණකාධිකාරී, ලේකම් සහ ප්‍රධාන කළමනාකරණ සහකාර යන නිලධාරීන් පත් කිරීම සුදුසු යැයි යෝජනා කරන ලදී.

මෙම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් ඉහත යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය. දැනට චෙක්පත් අත්සන් කරනු ලබන ගණකාධිකාරී එම්. ඩී. එස්. ප්‍රනාන්දු මහතා සහ ලේකම් එම්. එච්. සීලවතී මහත්මිය යන නිලධාරීන්ගේ අත්සන් සබරගමුව පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ සහතික කොට ඇති බැවින් ප්‍රධාන කළමනාකරණ සහකාර එස්. එච්. අමිතා කරුණාරත්න මහත්මියගේ අත්සන සහතික කිරීම සඳහා සබරගමුව පළාත් පාලන කොමසාරිස් වෙත යැවීමට තීරණය විය.

### 06:15 මැණික් කඩ කාමර බදු දීම පිළිබඳ සාකච්ඡාව - 2013.01.18

ඉහත සාකච්ඡාවේ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර එයට මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනස් අදහස් නොවූ බැවින් එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:16 මැණික් කඩ කාමර ඉහල මහලේ බදු කුලී වැඩිකිරීම සම්බන්ධව

මැණික් කඩ කාමර ඉහල මහලේ බදු කුලී රු. 2,000.00 දක්වා අඩු කරන මෙන් කඩකාමර හිමියන් විසින් ඉල්ලා ඇති බැවින් අදාල කුලිය රු. 2,000.00 දක්වා අඩු කිරීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනස් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:17 බස් නැවතුම්පොල බී - 07 දරන කඩ කාමරය පවරා දීම

බස්නැවතුම්පොල බී - 07 දරන කඩ කාමරය පරණගමගේ සුලොචනී මංජුලි පීරිස් යන අය වෙත පවරා දීමට ප්‍රසාද් ඉන්දික යන අය විසින් ඉල්ලීමක් කර ඇති බැවින් 25%ක ප්‍රමාණයක් අය කර ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්. ජේ. මලික් ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාව මහා සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

### 06:18 බළන්ගොඩ මහජන පොල මාළු වෙළඳසැල ලබා ගැනීම

බළන්ගොඩ මහජන පොල මාළු වෙළඳසැල ලබා ගැනීම පිළිබඳව ඩී. වී. රංජිත් යන අය විසින් සිදු කරන ලද ඉල්ලීමක් ඇති බැවින් රු. 7,500.00ක කුලිය මත ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

### 06:19 බලන්ගොඩ මහජන පොල මාළු වෙළඳසැල ලබා ගැනීම

බලන්ගොඩ මහජන පොල මාළු වෙළඳසැල ලබා ගැනීම පිළිබඳව එම්. එස්. එම්. විජේතුංග යන අය විසින් සිදු කරන ලද ඉල්ලීමක් ඇති බැවින් රු. 7,500.00ක කුලිය මත ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

### 06:20 බලන්ගොඩ නගර සභාව කෙටි පණිවුඩ සේවාවක් ආරම්භ කිරීම

බලන්ගොඩ නගර සභාව කෙටි පණිවුඩ සේවාවක් ආරම්භ කිරීම සම්බන්ධව සභාවේ පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු වන එච්. ඒ. ජී. සංකල්ප පේමදාස මහතා විසින් යොමු කර තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

### 06:21 2012.12.31 දිනට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව

2012.12.31 වන දිනට අදාල මෙම සභාවේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

මුදල් කාරක සභාවට ඉදිරිපත් කරන ලදුව එහි අනුමත වී ඇත.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

සභා අනුමැතිය සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් නොවීය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

සභා අනුමැතිය සඳහා ලංසු මිල ගණන් ඉදිරිපත් නොවීය.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි.

## 11. යෝජනා

### 11:01 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා

1. 2013 වර්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ මුදල් ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම සඳහා ගරු සභාවට යෝජනා ඉදිරිපත් කර ක්‍රියාත්මක කිරීම
2. පොදු ක්‍රීඩා පිටියට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ලබා දීම (පාපන්දු/ ක්‍රිකට් උපකරණ/මළල ක්‍රීඩකයන්ට පුහුණුවීම් සඳහා අවශ්‍ය කෝන්)

ඉහත පළමුවන යෝජනාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් යෝජනා කළ අතර, දෙවන යෝජනාවට අදාල ක්‍රීඩා භාණ්ඩ සඳහා මිල ගණන් සලකා බලා සභාවට දැරීමට නොහැකි තරමේ මිල ගණන් ඇති නම් ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට ද, පුහුණු වීම් සඳහා අවශ්‍ය

කෝන් 04ක් දැනට සභාව සතුව ඇති බැවින් ඒවා ලබා දීමට ද ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උපසභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඉහත යෝජනාවන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:02 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

1. තුඹගොඩ සවිකර ඇති 'No Parking' පුවරුව ඉවත් කිරීම
2. පසුගිය වැසි සමයේ අබලන් වී ඇති නගර සභාව සතු මාර්ග ප්‍රිමික්ස් යොදා පිළිසකර කිරීම
3. බලගහමුල ඇති වෙල් යායේ මදුරුවන් බෝවීමේ අවදානම ගැන අදාල බලධාරීන් දැනුවත් කිරීම
4. වැලිහරණාව පාරේ පල්ලිය අසල වැසි ජලය පිරීම සම්බන්ධව තීරණයක් ගැනීම

ඉහත යෝජනාවන් සඳහා ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ස්ථිර කරමින් ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් එක් එක් යෝජනාව සම්බන්ධයෙන් පහත පරිදි අදහස් දක්වන ලදී.

> *තුඹගොඩ 'No Parking' පුවරුව සවිකරලා තියෙන්නේ හෝටලයක් ඉදිරිපිට, ඒ නිසා හෝටල් හිමිකරුට වගේම ඒ ආශ්‍රිතව ව්‍යාපාර කටයුතු සිදු කළ පලතුරු වෙළෙන්දන්, ලොතරැයි අලෙවිකරුවන් ආදී විශාල පිරිසකට අසාධාරණයක් සිද්ධ වෙනවා. එම නිසා එම මාර්ගයේ ඔත්තේ ඉරට්ටේ ක්‍රමයට වාහන නැවැත්වීමට ඉඩ දීම කළ යුතු යැයි ඉල්ලා සිටිනවා.*

වෙනත් යෝජනා ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාවන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:02 ගරු නාගරික මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමා**

1. අබලන් තත්ත්වයට පත්ව ඇති පල්ලෙකුඹුර මාර්ගය පිළිසකර කිරීම
2. නගර සභාවට අයත් කඩ කාමර බදු දීමේ දී නීත්‍යානුකූල පිළිගත් ටෙන්ඩර් පටිපාටියකට අනුකූලව ටෙන්ඩර් කිරීම
3. බස් නැවතුම්පොල දෙපස සිට ජේ. එෆ්. හන්දිය දෙසට රථවාහන ධාවනය නැවැත්වීම
4. උඩ ඇල්ලෙපොල මහමෙව්නා මාවතේ අනතුරුදායක ලෙස පැමිණෙන වාහන වල වේගය අඩු කිරීමට බාධක ගැටිති යෙදීම.

ඉහත යෝජනාවන් මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාවන් අතරින් 1. හා 2. යෝජනාවන් සිදු කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය හිමි වූ අතර, 3. හා 4. යෝජනාවන් හි දැක්වෙන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා රථවාහන පොලිසියට දැනුම් දීමට තීරණය විය.

## 12. ආදායම් වියදම් හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 2012 නොවැම්බර් ලැබීම් විග්‍රහය

- 2012 නොවැම්බර් මාසය සඳහා වන ලැබීම් විග්‍රහය සභාවේ අනුමත විය**.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 5,401,203.18 |
| වෙනත් ලැබීම් | 3,093,782.20 |
| **මුළු ලැබීම්** | **8,494,985.38** |
| පුනරාවර්තන වියදම් | 2,582,443.33 |
| වෙනත් වියදම් | 880,324.46 |
| මුළු වියදම් | **3,462,767.79** |

- බළන්ගොඩ තානායමේ 2012.11.01 සිට 2012.11.30 වන දින දක්වා වෙළඳ හා ලාභ අලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලද අතර එය සභාවේ අනුමත විය.

### 12:02 2012.11.01 සිට 2012:11.30 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව

2012.11.01 සිට 2012:11.30 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාල මුළු ඉන්ධන වියදම රු. 365,787.70කි

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. 2013 වර්ෂය සඳහා කාරක සභා සාමාජිකයන් පත් කිරීම

### 13:01 ආපදා කළමනාකරණ කමිටුව සඳහා සාමාජිකයන් නම් කිරීම

බළන්ගොඩ නගර සභාවේ ආපදා කළමනාකරණය සම්බන්ධ සහා තීරණ ගැනීමට සහය වීමට සහ සභාවට ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට ආපදා කළමනාකරණ කමිටුවක් පත් කිරීම සඳහා ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමනක් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, පහත පරිදි එම කමිටුව සඳහා සාමාජිකයන් පත් කිරීමට මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

- ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා - ගරු ගරු සභාපති සහ කමිටුවේ සභාපති
- එම්. ඒ. එන්. ප්‍රේමතිලක මතා - මහජන සෞඛ්‍ය පරීක්ෂක සහ කමිටු ලේකම්
- එම්. ටී. එම්. රූමි මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී සහ කමිටු සාමාජික
- නිමල් කරුණාරත්න මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී සහ කමිටු සාමාජික
- එම්. ජේ. මලික් ෂා මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී සහ කමිටු සාමාජික
- ස්ථානාධිපති, බළන්ගොඩ පරිසර පොලිසිය - කමිටු සාමාජික
- යූ. වී. දැල බණ්ඩාර මහතා - වැඩ අධිකාරි සහ කමිටු සාමාජික
- එස්. එම්. එස්. ආනන්ද මහතා - ආදායම් පරීක්ෂක සහ කමිටු සාමාජික
- පරිසර නිලධාරී, බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කමිටු සාමාජික
- එම්. කේ. ජේ. නිශ්ශංක මහතා - කාර්මික නිලධාරී, බළන්ගොඩ විධායක ඉංජිනේරු කාර්යාලය, - කමිටු සාමාජික
- ඒ. බී. එස්. බණ්ඩාරවත්ත මහතා - ජ්‍යෙෂ්ඨ පුරවැසි සහ කමිටු සාමාජික
- කුසුමා අබේසිංහ මිය - පරිසර ක්‍රියාකාරිනී සහ කමිටු සාමාජික
- කවිරාජ් ගුණතිලක මහතා - ආයුර්වේද වෛද්‍යාචාර්ය සහ කමිටු සාමාජික
- මංජු විදානගමාච්චි මහතා – UN-Habitat

### 13:02 සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව

බලන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. අදහස් හා විරුද්ධව යෝජනා ඉදිරිපත් නොවූ බැවින් 2012 වර්ෂයේ සාමාජිකයන්ම 2013 වර්ෂය සඳහාත් පත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**13:03 පරිසර උපදේශන කාරක සභාව**

බලන්ගොඩ නගර සභාවේ පරිසර උපදේශන කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් 2012 වර්ෂයේ සාමාජිකයන්ම 2013 වර්ෂය සඳහා පත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**13:04 ප්‍රසම්පාදන මණ්ඩලය**

බලන්ගොඩ නගර සභාවේ ප්‍රසම්පාදන මණ්ඩලය සඳහා සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. අදහස් හා විරුද්ධව යෝජනා ඉදිරිපත් නොවූ බැවින් 2012 වර්ෂයේ සාමාජිකයන්ම 2013 වර්ෂය සඳහා පත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**13:05 කර්මාන්ත කාරක සභාව**

බලන්ගොඩ නගර සභාවේ කර්මාන්ත කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. අදහස් හා විරුද්ධව යෝජනා ඉදිරිපත් නොවූ බැවින් 2012 වර්ෂයේ සාමාජිකයන්ම 2013 වර්ෂය සඳහා පත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**13:06 තානායම් කාරක සභාව**

බලන්ගොඩ නගර සභාවේ තානායම් කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. අදහස් හා විරුද්ධව යෝජනා ඉදිරිපත් නොවූ බැවින් 2012 වර්ෂයේ සාමාජිකයන්ම 2013 වර්ෂය සඳහා පත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**13:07 මුදල් කාරක සභාව**

බලන්ගොඩ නගර සභාවේ මුදල් කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. අදහස් හා විරුද්ධව යෝජනා ඉදිරිපත් නොවූ බැවින් 2012 වර්ෂයේ සාමාජිකයන්ම 2013 වර්ෂය සඳහා පත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**13:02 පුස්තකාල උපදේශන කාරක සභාව**

බළන්ගොඩ නගර සභාවේ පුස්තකාල උපදේශන කාරක සභාව සඳහා සාමාජිකයන් පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. අදහස් හා විරුද්ධව යෝජනා ඉදිරිපත් නොවූ බැවින් 2012 වර්ෂයේ සාමාජිකයන්ම 2013 වර්ෂය සඳහා පත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 14. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 14:01 මුදල්, ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටු වාර්තාව

2012.12.19 වන දිනැති මුදල්, ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටු වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 14:01 සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු වාර්තාව

2012.12.20 වන දිනැති සෞඛ්‍ය හා ඝනඅපද්‍රව්‍ය කළමනාකරණ කමිටු වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දිය යුතු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 15. වැය මාරුව ඉදිරිපත් කිරීම:

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් මේ වර්ෂයට අදාල වැය මාරුව මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරෝධතාවයක් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 16. වෙනත් කරුණු:

### 16:01 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා:

ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා සභාව අමතමින්, පල්ලෙවෙල කර්මාන්තය සඳහා වැලි ලැබුණු බවත්, දැන් එම කර්මාන්තය සිදුවෙමින් පවතින බවත්, ඒ සම්බන්ධව තමන්ගේ ස්තුතිය පුද කරන බවත් දැන්වීය. ඒ සඳහා සිමෙන්ති ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටියේය. එමෙන්ම තුඹගොඩ සුදර්ශන විහාරස්ථානයේ වාර්ෂිකව පවත්වනු ලබන මිහිඳු පෙරහැර සඳහා නගර සභාවේ දායකත්වය සෑම වතාවකම ලබා දුන් බවත්, මෙවර මිහිඳු පෙරහැර සඳහා සුභසාධන කටයුතු වලට නගර සභාවෙන් වෙන් කර ඇති මුදලින් රු. 50,000.00ක් ලබා දීමට යෝජනා කරන බවත් සඳහන් කළේය.

සුදර්ශන පුර ජල ප්‍රශ්නය විසඳීම සඳහා ගරු සභාපතිතුමන්ට මැදිහත් වන මෙන් ද ඉල්ලා සිටියේය. එමෙන්ම මෙම සභාවේ දී භික්ෂූන් වහන්සේලාට නිසි ගෞරවය ලැබෙන පරිද්දෙන් සංවාද සිදුවිය යුතු බව පෙන්වා දුන්නේය. 2013 වර්ෂයේ ඉතාමත් සාර්ථකව මෙම සභාවේ කටයුතු සිදු කිරීම ගරු සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රීතුමන්ලාට හැකියාව ලැබෙනු ඇතැයි ප්‍රාර්ථනා කරමින් සිය කථාව අවසන් කරන ලදී.

ගරු උපසභාපතිතුමන් විසින් සිදු කරන ලද යෝජනාව ගරු සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් තුඹගොඩ සුදර්ශන විහාරයේ

මිහිඳු පෙරහැර සඳහා සුභසාධන කටයුතු වලට වෙන් කර ඇති මුදලින් රු. 50,000.00ක් ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**16:02 ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමාඃ**

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා සභාව අමතමින්, නගර වාසී ජනතාවට විශාල සේවාවක් සිදු කිරීමට 2013 වර්ෂයේ දී මෙම සභාවට හැකි වූ බවත්, මේ වන විට බළන්ගොඩ නගර සභාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර මට්ටමෙන් ද කතා බහට ලක්වන බවත්, ඒ සම්බන්ධව නාගරික මන්ත්‍රීවරයකු වශයෙන් ආඩම්බරයට පත් වන බවත්, එය බළන්ගොඩ ප්‍රදේශවාසීන්ට පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාවේම ජනතාවට ආඩම්බරයට කරුණක් බවත් ප්‍රකාශ කළේය. බළන්ගොඩ ප්‍රදේශයේ සිංහල බෞද්ධ ජනතාව සමඟ මුස්ලිම් ජනතාව සහෝදරත්වයෙන් ජීවත් වීම සම්බන්ධව ඉන්දුනීසියාවේ ප්‍රොබොලිංගො මහ නගර සභාවෙන් පැමිණි ගරු නගරාධිපතිතුමන් ඇතුළු පිරිස ප්‍රසාදය පළ කළ බව ද සඳහන් කළේය. මෙම කාර්යයන්ට පක්ෂ බේදයකින් තොරව ගරු සභාපතිතුමන් ලබා දුන් නායකත්වය විශිෂ්ට බව ද, ඒ සම්බන්ධව තමන්ගේ ස්තුතිය පුද කරන බව ද ප්‍රකාශ කළේය.

**16:03 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සභාව අමතමින් කරදියමුල්ල මාර්ගය ඉතා අබලන්ව තිබූ මාර්ගයක් බව ද, මේ වන විට සබරගමුව පළාත් මාර්ග ගරු අමාත්‍ය අතුල කුමාර රාහුබද්ද මැතිතුමාගේ මැදිහත් වීමෙන් එය සකස් කර ඇති බවත්, ඒ සම්බන්ධව ස්තුතිවන්ත වන බවත් ප්‍රකාශ කළේය.

**16:04 ගරු නාගරික ධර්මසේන සමරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා සභාව අමතමින්, ගරු උප සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඌරු මස් කඩයක් විවෘත කිරීම සම්බන්ධ යෝජනාවේ දී විරුද්ධ වූයේ දේශපාලනික හේතු මුල් කරගෙන නොවන බව ප්‍රකාශ කළේය. නගරයේ පොදු කටයුතු වල දී වැඩිම ප්‍රමාණයක් ආධාර ලබා දෙන්නේ මුස්ලිම් ජනතාව බව ද, සමාජ සේවා පදනමේ භාණ්ඩාගාරිකවරයා වශයෙන් තමා ඒ සම්බන්ධව හොඳින් දැන සිටින බව ද ප්‍රකාශ කළේය. බොහෝ කාලයක සිට බළන්ගොඩ නගරයේ ගව මස් වෙළඳසැල් තිබූ බව ද, එසේ වුවත් වර්තමානයේ මස් ආහාරයට නොගන්නා පිරිස වැඩි බව ද සඳහන් කළේය.

එමෙන්ම බළන්ගොඩ ළමා උද්‍යානය කාටත් ප්‍රයෝජනවත් ස්ථානයක් වශයෙන් ගොඩ නැංවීමට ගරු මන්ත්‍රීතුමන්ලා සියළු දෙනාගේ සහයෝගය බලාපොරොත්තු වන බව ද වැඩි දුරටත් සඳහන් කළේය.

**16:05 ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා සභාව අමතමින්, බළන්ගොඩ තුඹගොඩ සාංඝික විහාරස්ථානයේ ඉඩම හරහා නගරයේම අපද්‍රව්‍ය ගලා යන බව ද ඒ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගැනීම සිදු කළ යුතු බව ද ප්‍රකාශ කළේය. එමෙන්ම පසුගිය වසරේ සභා අරමුදල් වලින් මෙන්ම මග නැගුම, ගම නැගුම වැනි ව්‍යාපෘතින් හරහා ද ජනතාවට සේවයක් සිදු කරීමට හැකියාව ලැබීම සම්බන්ධයෙන් සතුටට පත් වන බව ද ප්‍රකාශ කළේය.

**16:06 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා සභාව අමතමින්, දේශපාලන ක්ෂේත්‍රයේ බිම් මට්ටමේ සිටින මන්ත්‍රීවරුන් වශයෙන් නාගරික මන්ත්‍රීතුමන්ලා හට ද මධ්‍යම රජයෙන් සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කරන්නේ නම් ඉතා වැදගත් වන බව ප්‍රකාශ කළේය. එමෙන්ම පක්ෂ බේදයකින් තොරව ගරු සභාපතිතුමන් විසින් අවශ්‍ය ඕනෑම අවස්ථාවක මහජන කාර්යයන් සඳහා සහයෝගය ලබා දීම සම්බන්ධව එතුමන් හට

ස්තුතිවන්ත විය යුතු බව ද වැඩි දුරටත් සඳහන් කළේය. එමෙන්ම කහටපිටිය මාර්ගයේ සංවර්ධන කටයුතු සඳහා ලබන වර්ෂයේ දී ප්‍රමුඛතාවයක් ලබා දීම අවශ්‍ය කරුණක් බවද සිහිපත් කළේය.

**16:07 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් සභාව අමතමින්, දොරවෙල ප්‍රදේශයේ පානීය ජල ටැංකිය සම්බන්ධ ප්‍රශ්නයට තමන් සම්බන්ධ වූයේ ගරු සභාපතිතුමන් අපහසුතාවයට පත් කිරීමට නොව, ගරු නාගරික මන්ත්‍රී අසංක විජයසිංහ මැතිතුමන් විසින් සිදු කරන ලද ඉල්ලීමට අනුව බව සඳහන් කළේය.

බළන්ගොඩ නගර සභාවට ජාතික මට්ටමේ ජයග්‍රහණ ලබා ගැනීමට ක්‍රියාකරන ලද ගරු සභාපතිතුමන් ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වන බව ද, එමෙන්ම 2012 වර්ෂයේ දී බළන්ගොඩ නගරයේ සංවර්ධන කටයුතු සඳහා දායකත්වය ලබා දෙන ලද, පාර්ලිමේන්තු ගරු මන්ත්‍රී රන්ජන් රාමනායක මැතිතුමා, පළාත් සභා අමාත්‍ය භාණු මුණිප්‍රිය මැතිතුමා ඇතුළු පළාත් සභා ගරු මන්ත්‍රීතුමන්ලාටත්, ගරු සභාපතිතුමන්ටත්, එයට සම්බන්ධව සහය දුන් ප්‍රාදේශිය ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, නගර සභාවේ කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පල කරන බව ප්‍රකාශ කළේය.

## 17. අවසානය

**ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

2012 වර්ෂය ඉතාමත් සාර්ථකව ජනතාවට සේවාවක් සිදු කිරීමට අතිගරු ජනාධිපතිතුමා, ආර්ථික සංවර්ධන ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා සහ ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා, පළාත් සභා ගරු අමාත්‍ය භාණු මුණිප්‍රිය මැතිතුමා ඇතුළු නොයෙක් ආකාරයෙන් සහය දුන් සියළුම දෙනාට ස්තුතිවන්ත වන බව ද, ලබන වසරේද ජනතාවට සේවය සැලසීම සඳහා අප ධෛර්යමත් කරමින් කටයුතු කිරීමට හැකි වේවා යැයි ද ප්‍රාර්ථනා කළේය. එමෙන්ම සියළු දෙනාටම සුභ නව වසරක් වේවා යැයි ප්‍රාර්ථනා කරමින් සභාවේ වැඩ කටයුතු ප. ව. 1.30ට පමණ අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.